051020

AL/2026/21/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

| | | |
|---|---|---|
| ආර්ථික විද්‍යාව I<br>பொருளியல் I<br>Economics I | 21 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**
- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ※ උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ※ 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන** හෝ පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** පහත සඳහන් මාතෘකා අතරින් සූක්ෂ්ම ආර්ථික විද්‍යාත්මක මාතෘකාව වන්නේ,
(1) රජයේ නියාමනය මගින් දුම්රිය ප්‍රවාහන සේවාව කෙරෙහි ඇති කෙරෙන බලපෑම වේ.
(2) සාමාන්‍ය මිල මට්ටම වේගයෙන් ඉහළ යාමේ හේතු වේ.
(3) ස්ථාවර ආර්ථික වෘද්ධියක් අත්කර ගැනීමට ඇති බාධක වේ.
(4) රජයේ අයවැය හිඟය උද්ධමනයට ඇති කරන බලපෑම වේ.
(5) සමතුලිත ජාතික ආදායම් මට්ටම තීරණය වීම වේ.

**2.** අසීමිත මිනිස් වුවමනාවන්ට සාපේක්ෂ ව සම්පත් හිඟකමෙහි ප්‍රතිවිපාකයක් වන්නේ පහත සඳහන් කවරක් ද?
(1) භාණ්ඩ හා සේවා වෙළෙඳපොළ අධි-සැපයුමක් නොපැවතීම
(2) සම්පත් කාර්යක්ෂම ලෙස බෙදා වෙන්කොට දීමට වෙළෙඳපොළට නොහැකි වීම
(3) සියලු ම භාණ්ඩ හා සේවාවන්ට වෙළෙඳපොළ මිලක් පැවතීම
(4) නිෂ්පාදන සාධක සේවා නියුක්ත කිරීමේ දී ආවස්ථික පිරිවැයක් පැවතීම
(5) ඇතැම් සම්පත්වල පවතින ප්‍රමාණය, ඒවා සඳහා ඇති ඉල්ලුමටත් වඩා වැඩි වීම

**3.** තේ සහ ටයර් නිෂ්පාදනය කරන රටක් ගැන සලකා බලන්න. සම්පත් පූර්ණ වශයෙන් සේවා නියුක්ත කොට ඇත්නම් සහ ටයර් නිෂ්පාදන අංශයෙහි පමණක් තාක්ෂණික ප්‍රගතියක් පවතී නම්, තේ සහ ටයර් නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය පහත සඳහන් කවර ආකාරයකින් වෙනස් වේද?

| | තේ නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය | ටයර් නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය |
|---|---|---|
| (1) | වැඩි වේ | වැඩි වේ |
| (2) | වැඩි වේ | අඩු වේ |
| (3) | වෙනස් නොවේ | වැඩි වේ |
| (4) | අඩු වේ | වැඩි වේ |
| (5) | අඩු වේ | අඩු වේ |

**4.** වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක් සමග සංසන්දනය කරන විට මධ්‍යගත සැලසුම් ආර්ථික පද්ධතියක නවෝත්පාදන සඳහා ඇති උද්යෝගය දුර්වල විය හැක්කේ ඇයි?
(1) ව්‍යාපාරික ආයතන අතර පවත්නා අධික තරගකාරිත්වය මගින් අනුකරණය දිරිගැන්වීම
(2) ශක්තිමත් බුද්ධිමය දේපළ අයිතිවාසිකම් පැවතීම
(3) ලාභ ඉපැයීමේ අරමුණු ප්‍රමාණවත් නොවීම
(4) පාරිභෝගික රුචිකත්වයන් නිතර වෙනස් වීම
(5) ආයෝජන තීරණ සම්පූර්ණයෙන් ම විමධ්‍යගතව තිබීම

03030001180111020

[දෙවැනි පිටුව බලන්න

Scanned with CamScanner

Past Papers Wiki



5. අනෙකුත් කරුණු නො වෙනස් ව තිබිය දී භාණ්ඩයෙහි මිල අඩු වූ විට, පාරිභෝගිකයන් සාමාන්‍යයෙන් එම භාණ්ඩයෙන් මිලදී ගන්නා ප්‍රමාණය වැඩි කිරීමට එක් හේතුවක් වන්නේ,
   (1) ආදායම වැඩි වන විට අතිරේක ඒකකයක් සඳහා ගෙවීමට ඇති කැමැත්ත වැඩි වීම ය.
   (2) පාරිභෝගිකයන්ගේ ක්‍රය ශක්තිය වැඩි වීම ය.
   (3) පාරිභෝගිකයන් ආදේශක භාණ්ඩ වැඩි ප්‍රමාණයක් මිල දී ගැනීම ය.
   (4) පාරිභෝගිකයන් අනුපූරක භාණ්ඩ වැඩි ප්‍රමාණයක් මිල දී ගැනීම ය.
   (5) අනාගතයේ මිල පහළ යනු ඇතැයි පාරිභෝගිකයන් අපේක්ෂා කිරීම ය.

6. වෙළෙඳපොළ සමතුලිතතාවෙහි පවතින යම් විශේෂිත කාල පරිච්ඡේදයන්හි දී, කිසියම් භාණ්ඩයක මිල සහ එම භාණ්ඩය මත කරනු ලබන මුළු පැහැදම වගුවෙහි දැක්වේ.

| කාල පරිච්ඡේදය | මිල (රු.) | මුළු පැහැදම (රු.) |
|---|---|---|
| 1 | 15 | 750 |
| 2 | 8 | 400 |
| 3 | 5 | 250 |
| 4 | 10 | 500 |
| 5 | 6 | 300 |


   මෙම දත්ත මගින් කුමක් නිගමනය කළ හැකි ද?
   (1) මෙම භාණ්ඩය බාල භාණ්ඩයකි.
   (2) මෙම භාණ්ඩය නිෂ්පාදනයේ දී ස්ථාවර ආවස්ථික පිරිවැයක් පවතී.
   (3) ඉල්ලුමේ මිල නම්‍යතාව එකට සමාන වේ.
   (4) සැපයුමේ මිල නම්‍යතාව ශුන්‍යයට සමාන වේ.
   (5) මෙම භාණ්ඩය සුඛෝපභෝගී භාණ්ඩයකි.

7. එක්තරා වසරක දී කිසියම් භාණ්ඩයක ඒකකයක මිල රු. 100 බැගින් ඒකක 5 000ක් අලෙවිකොට ඇත. ඉන්පසු වසරක දී ඒකකයක මිල රු. 125 බැගින් ඒකක 8 000ක් අලෙවිකොට ඇත. පාරිභෝගික අභිරුචිය නො වෙනස් ව පැවතියේ නම්, මෙම වසර දෙක අතර ඇති වූ වෙනසට හේතුව කවරක් විය හැකි ද?
   (1) නිෂ්පාදනය සඳහා යොදා ගැනෙන අමුද්‍රව්‍යවල මිල අඩුවීම
   (2) නිෂ්පාදන ක්‍රියාවලියෙහි තාක්ෂණික දියුණුව
   (3) භාණ්ඩය නිපදවීමේ දී ඒකාධිකාරයක් හටගෙන තිබීම
   (4) අනුපූරක භාණ්ඩයක මිල ඉහළ යාම
   (5) ආදේශක භාණ්ඩයක මිල ඉහළ යාම

8. අන්තර්ජාල සේවා පහක මිල ඉහළ යාම සහ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය අඩුවීම අතර සම්බන්ධතාව පහත දැක්වේ. අඩු ම මිල ඉල්ලුම් නම්‍යතාව ඇත්තේ කවර සේවාවට ද?

| | අන්තර්ජාල සේවාව | මිල ඉහළ යාම (%) | ඉල්ලුම් ප්‍රමාණය අඩුවීම (%) |
|---|---|---|---|
| (1) | A | 10 | 8 |
| (2) | B | 6 | 6 |
| (3) | C | 10 | 4 |
| (4) | D | 3 | 7 |
| (5) | E | 10 | 0 |

9. ප්‍රධාන නගරයක බස් ගමනාගමනය සඳහා ඇති ඉල්ලුම් වක්‍රය සහ සැපයුම් වක්‍රය රූපසටහනෙහි දැක්වේ. පරිසර දූෂණය සහ රථවාහන තදබදය අඩු කිරීම සඳහා මහ නගර සභාව බස් සමාගම්වලට ගෙවීම් කරමින්, මහජනතාවට නොමිලයේ බස් ප්‍රවාහන සේවය සැපයීමට තීරණය කොට ඇත.




   මෙම ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයක් ලෙස පාරිභෝගික අතිරික්තයෙහි වැඩිවීම
   (1) PTE වේ. (2) OPEK වේ.
   (3) QEK වේ. (4) OTK වේ.
   (5) OMEK වේ.

[තුන්වැනි පිටුව බලන්න



Scanned with CamScanner

10. වෙළෙඳපොළෙහි මුලින් පැවති ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහතින් දී ඇති බව සලකන්න.

$Q_D = 200 - 3P$ $\qquad$ $Q_S = -20 + 2P$

සෑම මිලක දී ම ඉල්ලුම් ප්‍රමාණය ඒකක 20කින් අඩුවේ නම් හා සෑම මිලක දී ම සැපයුම් ප්‍රමාණය ඒකක 20 කින් වැඩිවේ නම්, නව සමතුලිත මිල වනුයේ

(1) රු. 20කි. (2) රු. 30කි. (3) රු. 36කි. (4) රු. 44කි. (5) රු. 72කි.

051020


11. පහත දැක්වෙන ඉල්ලුම් සහ සැපයුම් සමීකරණවලින් විස්තර කෙරෙන වෙළෙඳපොළ සැලකිල්ලට ගන්න.

$P = 140 - Q_D$ (ඉල්ලුම) $\qquad$ $P = 40 + Q_S$ (සැපයුම)

මෙම වෙළෙඳපොළ සමතුලිතයේ දී ආර්ථික අතිරික්තය වනුයේ,

(1) 1 250කි. (2) 2 500කි. (3) 3 250කි. (4) 4 500කි. (5) 5 750කි.

12. මෙම රූපසටහන මගින් දැක්වෙන වෙළෙඳපොළෙහි උපරිම මිලක් R ලෙස නියම කොට ඇත්නම් පාරිභෝගික අතිරික්තය නියෝජනය කරන ප්‍රදේශය වනුයේ,




(1) PEDO ය.
(2) PSE ය.
(3) RSTJ ය.
(4) RSB ය.
(5) RJMO ය.

13. X භාණ්ඩය සඳහා ඇති වෙළෙඳපොළ සමතුලිත තත්ත්වයේ පවතින බවත්, ඒකකයක් රු. 50ක මිලකට ඒකක 1000ක් අලෙවි කළ බවත් සලකන්න. රජය X භාණ්ඩයේ නිෂ්පාදකයන් වෙත ඒකකයකට රු. 5 බැගින් සහනාධාරයක් ලබා දෙයි. සහනාධාරය සඳහා රජය දරන මුළු වියදම අවම වන්නේ කවර තත්ත්වයන් යටතේ ද?

| | X භාණ්ඩය සඳහා ඇති ඉල්ලුමේ මිල නම්‍යතාව | X භාණ්ඩයේ සැපයුමේ මිල නම්‍යතාව |
|---|---|---|
| (1) | 1ට අඩු | 1ට අඩු |
| (2) | 1ට අඩු | 1ට වැඩි |
| (3) | 1ට වැඩි | 1ට අඩු |
| (4) | 1ට වැඩි | 1ට වැඩි |
| (5) | 1ට වැඩි | 1ට සමාන |

14. කෘෂිකාර්මික බෝග සඳහා අවම මිලක් හඳුන්වාදීමට රජය කටයුතු කරන්නේ ඇයි ද යන්න වඩාත් හොඳින් පැහැදිලි කරනුයේ පහත දැක්වෙන කුමන ප්‍රකාශය ද?

(1) පාරිභෝගික වියදම අඩු කිරීම සඳහා
(2) ඉල්ලුමේ උච්චාවචන අඩු කරමින් පාරිභෝගික මිල ගණන් ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම සඳහා
(3) දිළිඳු පාරිභෝගිකයන්ට ප්‍රතිලාභ සැලසීම සඳහා
(4) වෙළෙඳපොළ තරගකාරිත්වය වැඩි කිරීම සඳහා
(5) නිෂ්පාදකයන්ට ඉහළ සහ ස්ථාවර ආදායමක් සහතික කිරීම සඳහා

[හතරවැනි පිටුව බලන්න

Scanned with CamScanner

15. පහත දැක්වෙන වගුව තරගකාරී වෙළෙඳපොළක කටයුතු කරන නිෂ්පාදන ආයතනයක් විසින් අලෙවි කරන ලද විවිධ නිමැවුම් මට්ටම් සඳහා වූ මුළු විචල්‍ය පිරිවැය පෙන්නුම් කරයි.

| නිමැවුම (ඒකක) | මුළු විචල්‍ය පිරිවැය (රු.) |
|---|---|
| 1 | 60 |
| 2 | 90 |
| 3 | 110 |
| 4 | 125 |
| 5 | 130 |

මුළු ස්ථාවර පිරිවැය රු. 100ක් වේ යැ යි උපකල්පනය කරන්න. මෙම පිරිවැය හා නිමැවුම් දත්ත පදනම් කර ගනිමින්, ආයතනය නිමැවුම් ඒකක 3 සිට 4 දක්වා වැඩිකරන විට ආන්තික පිරිවැයත්, ඒකක 5ක් නිෂ්පාදනය කරන විට සාමාන්‍ය මුළු පිරිවැයත් ගණනය කරන්න.

| | ආන්තික පිරිවැය (රු.) | සාමාන්‍ය මුළු පිරිවැය (රු.) |
|---|---|---|
| (1) | 15 | 26 |
| (2) | 30 | 70 |
| (3) | 20 | 80 |
| (4) | 15 | 46 |
| (5) | 60 | 56 |

16. අනෙකුත් කරුණු නො වෙනස් ව තිබිය දී තරගකාරී නිෂ්පාදන ආයතනයක විචල්‍ය යෙදවුමෙහි මිල ඉහළ යන්නේ නම්, පහත සඳහන් කවරක් සිදුවනු ඇත් ද?
(1) ආයතනය තම නිෂ්පාදන මට්ටම වැඩි කරයි.
(2) ආයතනය තම නිෂ්පාදන මට්ටම අඩු කරයි.
(3) ආයතනයේ සාමාන්‍ය මුළු පිරිවැය අඩු වේ.
(4) කෙටි කාලයේ දී භාණ්ඩයේ මිල අඩු වේ.
(5) සෑම නිෂ්පාදන මට්ටමක දී ම ආයතනයේ ආන්තික පිරිවැය අඩු වේ.

17. කෙටි කාලයේ දී පූර්ණ තරගකාරී ආයතනයක්, ආර්ථික අලාභ ලබමින් සිටින බව උපකල්පනය කරන්න. එම ආයතනය තවදුරටත් නිෂ්පාදනයෙහි නිරත වෙමින් භාණ්ඩ අලෙවි කරමින් සිටී නම් පහත සඳහන් කවරක් සත්‍ය වේ ද?
(1) ආයතනය තම ස්ථාවර පිරිවැය සහ විචල්‍ය පිරිවැය සියල්ල ම පියවා ගනී.
(2) ආයතනය තම ස්ථාවර පිරිවැය සියල්ල ම පියවා ගන්නා නමුත් විචල්‍ය පිරිවැය සියල්ල පියවා නො ගනී.
(3) ආයතනය විචල්‍ය පිරිවැය සියල්ල ම පියවා ගන්නා නමුත් ස්ථාවර පිරිවැය සියල්ල පියවා නො ගනී.
(4) ආයතනය තම ප්‍රත්‍යක්ෂ පිරිවැය සියල්ල ම පියවා ගන්නා නමුත් ආරෝපිත පිරිවැය සියල්ල පියවා නො ගනී.
(5) අලාභ අවමකර ගැනීම සඳහා ආයතනය තම භාණ්ඩවල මිල ඉහළ නංවා තිබිය යුතු ය.

18. ලාභ උපරිමනය කිරීමෙහි නිරත ව සිටින ආයතනයක්, කෙටි කාලයේ දී නිෂ්පාදනය නතර කොට වසා දමනුයේ ආයතනයේ මුළු අයභාරය
(1) මුළු පිරිවැයට වඩා අඩු වූ විට දී ය.
(2) මුළු ආවස්ථික පිරිවැයට වඩා අඩු වූ විට දී ය.
(3) මුළු විචල්‍ය පිරිවැයට වඩා අඩු වූ විට දී ය.
(4) මුළු ප්‍රත්‍යක්ෂ පිරිවැයට වඩා අඩු වූ විට දී ය.
(5) මුළු ආරෝපිත පිරිවැයට වඩා අඩු වූ විට දී ය.

19. රටක චක්‍රීය ආදායම් ප්‍රවාහය වැඩි කිරීමට වඩාත් ම ඉඩ ඇති දෙය කුමක් ද?
(1) අයවැය හිඟය වැඩිවීම
(2) ආනයන ඉහළ යාම
(3) පොලී අනුපාතිකය ඉහළ යාම
(4) කුටුම්බවල ආන්තික ඉතුරුම් නැඹියාව ඉහළ යාම
(5) වක්‍ර බදු ඉහළ යාම

[පස්වැනි පිටුව බලන්න



Past Papers Wiki
Scanned with CamScanner

**20.** පහත සඳහන් දෑ අතරින් නිෂ්පාදනය නොකළ මූලධන නොවන වත්කමක් ලෙස සැලකෙන්නේ කුමක් ද?
(1) යන්ත්‍රෝපකරණ (2) පරිගණක මෘදුකාංග
(3) නිමි භාණ්ඩ තොග (4) ගුවන් විදුලි සංඛ්‍යාත
(5) නේවාසික ගොඩනැගිලි

**21.** මූලික මිල යටතේ දළ එකතු කළ අගය රු. මිලියන 2 000ක් ද, නිෂ්පාදනය මත සහනාධාර අඩු කළ වෙනත් බදු රු. මිලියන 100ක් ද නිෂ්පාදිත මත බදු රු. මිලියන 450ක් ද නිෂ්පාදිත මත සහනාධාර රු. මිලියන 50ක් ද වේ නම් දළ දේශීය නිෂ්පාදිතය
(1) රු. මිලියන 1 600ක් වේ. (2) රු. මිලියන 1 900ක් වේ.
(3) රු. මිලියන 2 400ක් වේ. (4) රු. මිලියන 2 500ක් වේ.
(5) රු. මිලියන 2 600ක් වේ.

**22.** කිසියම් කල්පිත ආර්ථිකයක තෝරාගත් සාර්ව ආර්ථික දත්ත කිහිපයක් වගුවෙහි දැක්වේ.

| වර්ෂය | නාමික දළ දේශීය නිෂ්පාදිතය (රු. බිලියන) | පොදු මිල මට්ටම් දර්ශකය |
|---|---|---|
| 1වන වර්ෂය | 200 | 100 |
| 2වන වර්ෂය | 300 | 125 |
| 3වන වර්ෂය | 450 | 150 |

තුන්වන වර්ෂයේ දී මෙම ආර්ථිකයෙහි මූර්ත ආර්ථික වෘද්ධි අනුපාතිකය කොපමණ ද?
(1) 5% (2) 10% (3) 15%
(4) 20% (5) 25%

**23.** පහත සඳහන් දෑ අතරින් ජාතික ආදායම් ගුණකයේ විශාලත්වය බෙහෙවින් ම අඩු කරන්නේ පහත සඳහන් කවරක් ද?
(1) ආන්තික පරිභෝජන නැඹියාව වැඩි වීම (2) බදු අනුපාතිකය අඩු වීම
(3) ආන්තික ඉතුරුම් අනුපාතිකය වැඩි වීම (4) ස්වායත්ත පරිභෝජනය වැඩි වීම
(5) ආයෝජනය වැඩි වීම

**24.** කේනිසියානු කතිර (Keynesian Cross) රූපසටහනෙහි $45^0$ රේඛාව නිරූපණය කරන්නේ,
(1) ඉතිරි කිරීම් ආයෝජනයට සමාන වන සියලු ම ලක්ෂ්‍යයන් ය.
(2) සමාහාර ආදායම සමාහාර වියදමට සමාන වන සියලු ම ලක්ෂ්‍යයන් ය.
(3) සියලු ම පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම් ය.
(4) සමාහාර ඉල්ලුම හා මිල මට්ටම අතර සම්බන්ධතාව ය.
(5) පරිභෝජන වියදම, වැය කළ හැකි ආදායමට සමාන වන සියලු ම ලක්ෂ්‍යයන් ය.

**25.** සංවෘත ආර්ථික ආකෘතියක පරිභෝජනය (C), බදු (T), ආයෝජනය (I) සහ ආණ්ඩුවේ මිල දී ගැනීම (G) පහත දැක්වේ.

C = 200 + 0.75 Yd, (Yd යනු වැය කළ හැකි ආදායම වේ.), T = 400, I = 500 සහ G = 600

සමතුලිතතාවේ දී ජාතික ආදායම (Y), පරිභෝජනය (C) හා ඉතුරුම් (S) කොපමණ වේ දැයි ඇස්තමේන්තු කරන්න.

| | Y | C | S |
|---|---|---|---|
| (1) | 3 600 | 1 200 | 600 |
| (2) | 4 000 | 2 900 | 700 |
| (3) | 4 000 | 2 700 | 1 100 |
| (4) | 3 200 | 2 000 | 600 |
| (5) | 6 400 | 4 700 | 1 700 |

**26.** කොළඹ පාරිභෝගික මිල දර්ශකය මගින් මනිනු ලබන පරිදි ශ්‍රී ලංකාව ඉහළ ම උද්ධමන අනුපාතිකය වාර්තා කළ වර්ෂය කුමක් ද?
(1) 2021 (2) 2022 (3) 2023 (4) 2024 (5) 2025

PAST PAPERS WIKI



051020
0103000118011102O
Scanned with CamScanner

27. මූලික උද්ධමනය ඉක්මවා යාමට මතුපිට උද්ධමනයට බොහෝ දුරට හේතු විය හැක්කේ පහත සඳහන් අවස්ථා අතරින් කවර අවස්ථාවක් ද?
(1) ආහාර හා ඉන්ධන මිල ස්ථාවර ව පැවතීම
(2) ආනයන මිල පහළ යාම
(3) ජාත්‍යන්තර තෙල් මිලෙහි තාවකාලික ඉහළ යාම
(4) සමස්ත ඉල්ලුම අඩු කරන දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය
(5) වක්‍ර බදුවල පහළ වැටීම

28. මහ බැංකුව විවෘත වෙළෙඳපොළෙන් රුපියල් මිලියන 200ක සුරකුම්පත් මිල දී ගන්නා බව සලකන්න. අවශ්‍ය සංචිත අනුපාතය 10%ක් වන අතර බැංකු අධි සංචිත තබා නොගන්නා බවත් මුදල් කාන්දුවීම් නොමැති බවත්, උපකල්පනය කරන්න. බැංකු පද්ධතිය සියලු ම ගැළපුම් සිදුකළ පසු සංචිත, ඉල්ලුම් තැන්පතු හා ණය ප්‍රමාණය පහත සඳහන් කුමන අගයන්ගෙන් වැඩිවනු ඇත් ද?

| | සංචිත (රු. මිලියන) | ඉල්ලුම් තැන්පතු (රු. මිලියන) | ණය (රු. මිලියන) |
|---|---|---|---|
| (1) | 200 | 2 000 | 2 000 |
| (2) | 2 000 | 1 800 | 2 000 |
| (3) | 1 800 | 2 000 | 1 800 |
| (4) | 200 | 1 800 | 2 000 |
| (5) | 200 | 2 000 | 1 800 |

29. ගෘහණියක් හදිසි අවශ්‍යතා සඳහා නිවසේ තබාගෙන සිටි රු. 10 000ක මුදලක් වාණිජ බැංකුවක පවත්නා තම ජංගම ගිණුමෙහි තැන්පත් කරයි. මුදල් සමස්ත කෙරෙහි මෙම තැන්පතුව බලපානුයේ කෙසේ ද?
(1) $M_1$ පහළ යන අතර $M_2$ ඉහළ යයි.
(2) $M_1$ නොවෙනස් ව පවතින අතර $M_2$ ඉහළ යයි.
(3) $M_1$ ඉහළ යන අතර $M_2$ නොවෙනස් ව පවතී.
(4) $M_1$ සහ $M_2$ ඉහළ යයි.
(5) $M_1$ සහ $M_2$ නොවෙනස් ව පවතී.

30. ශ්‍රී ලංකාවේ නව මහ බැංකු පනත යටතේ මහ බැංකුවේ ස්වාධීනත්වය ශක්තිමත් කිරීමට ප්‍රධාන හේතුව වඩාත් හොඳින් පැහැදිලි කරනුයේ පහත සඳහන් කවරකින් ද?
(1) රජයේ අයවැය හිඟයන් සීමාවකින් තොර ව මූල්‍යනය කිරීම සඳහා මහ බැංකුවට ඉඩ ලබා දීම.
(2) මූල්‍ය ප්‍රතිපත්ති තීරණ ගැනීමේ දී දේශපාලන බලපෑම අඩුකොට ප්‍රතිපත්ති විශ්වාසනීයත්වය වැඩි කිරීම.
(3) මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම මුළුමනින් ම මූල්‍ය පද්ධතියේ සිටින වාණිජ බැංකු වෙත පැවරීම.
(4) උද්ධමන පීඩනය ඉහළ යමින් පවතින අවස්ථාවල දී පවා, පොලී අනුපාතික අඩු අගයක පවත්වා ගැනීම තහවුරු කිරීම.
(5) මහ බැංකුව විසින් සිදුකරන වාණිජ බැංකු ක්‍රියාකාරකම් සියල්ල ඉන් ඉවත් කිරීම.

31. සෘණ බාහිරතා පවතින අවස්ථාවක වෙළෙඳපොළ අසාර්ථකත්වය හටගන්නේ ඇයි ද යන්න වඩාත් හොඳින් පැහැදිලි කරන්නේ පහත සඳහන් කවරක් ද?
(1) ආන්තික සමාජ ප්‍රතිලාභ, ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ ඉක්මවා යෑම.
(2) ආන්තික පෞද්ගලික පිරිවැය, ආන්තික සමාජ පිරිවැය ඉක්මවා යෑම.
(3) ආන්තික සමාජ පිරිවැය, ආන්තික පෞද්ගලික පිරිවැය ඉක්මවා යෑම.
(4) පාරිභෝගිකයන්ට තාර්කික අපේක්ෂා නොතිබීම.
(5) රජය අධික බදු පැනවීම.

32. අනුක්‍රමික අය බදු පද්ධතියක් තුළ
(1) ආදායම වැඩිවීමත් සමග බදු අනුපාතික අඩු වේ.
(2) සියලුදෙනා ම සමාන ප්‍රමාණයක් බදු වශයෙන් ගෙවති.
(3) ආදායම වැඩි වන විට බදු අනුපාතික ඉහළ නගී.
(4) වක්‍ර බදු සෘජු බදු අභිබවා යයි.
(5) ආණ්ඩුවේ වියදම, අයභාරය ඉක්මවා යයි.



Scanned with CamScanner

**33.** සම්පත් බෙදා වෙන්කිරීමේ විකෘතිතා හටගැනීම අවම කිරීම අවධාරණය කෙරෙන අයබදු මූලධර්මය කවරක් ද?
(1) මධ්‍යස්තභාවය (2) නිශ්චිතභාවය (3) සාධාරණත්වය (4) සරලබව (5) ඵලදායිතාව

**34.** පොදු භාණ්ඩ හා පොදු සම්පත් අතර වෙනස නිවැරදි ව දැක්වෙන ප්‍රකාශය කවරක් ද?
(1) පොදු භාණ්ඩ පරිභෝජනයේ දී තරගකාරීත්වයක් ඇති අතර, පොදු සම්පත් පරිභෝජනය තරගකාරී නොවේ.
(2) පොදු භාණ්ඩ පරිභෝජනය වළක්වාලිය නොහැකි හා තරගකාරී නොවන අතර, පොදු සම්පත් පරිභෝජනය වළක්වාලිය නොහැකි වන නමුත් තරගකාරී වේ.
(3) පොදු සම්පත් පරිභෝජනය වළක්වාලිය හැකි වන අතර, පොදු භාණ්ඩ පරිභෝජනය තරගකාරී වේ.
(4) පොදු භාණ්ඩ සෑම විට ම සෘණ බාහිරතා ජනනය කරන අතර පොදු සම්පත් සෑම විට ම ධන බාහිරතා ඇති කරයි.
(5) පොදු සම්පත් සෑම විට ම පෞද්ගලික හිමිකම යටතේ පවතින අතර පොදු භාණ්ඩ සෑම විට ම රජය මඟින් සපයනු ලැබේ.

**35.** තුලිත අයවැය ගුණකය යෝජනා කරනුයේ,
(1) බදු හා ආණ්ඩුවේ මිල දී ගැනීම් සමාන ප්‍රමාණයකින් වැඩි කළ ද ජාතික ආදායම ඉහළ යා හැකි බව ය.
(2) බදු අඩු කිරීම් සෑම විට ම උද්ධමනය පහළ හෙළන බව ය.
(3) අයවැය හිඟයන් ස්වයංක්‍රියව ම විරැකියාව අඩු කොට ආර්ථික වෘද්ධිය ඉහළ දමන බව ය.
(4) ආණ්ඩුවේ වියදම්වල ගුණක ප්‍රතිවිපාකයක් නොමැති බව ය.
(5) බදු වැඩි කිරීමට සමානව ආණ්ඩුව වියදම් කිරීම නිසා දුප්පත්කම නිශ්චිතව ම අඩුවන බව ය.

**36.** නිරපේක්ෂ වාසිය සහ සාපේක්ෂ වාසිය අතර ප්‍රධාන වෙනස වන්නේ, සාපේක්ෂ වාසියේ පදනම
(1) ශ්‍රම ඵලදායිතාව වීම ය.
(2) සම්පත් හිමිකාරීත්වය වීම ය.
(3) ආවස්ථික පිරිවැයේ වෙනස්කම් වීම ය.
(4) ජනගහනයේ ප්‍රමාණය වීම ය.
(5) අපනයන පරිමාව වීම ය.

**37.** අවසාන භාණ්ඩ ආනයන මත 20% ක තීරු බද්දක් පනවා ඇති අතර, අමුද්‍රව්‍ය ආනයන මත 5% ක තීරු බද්දක් පනවා ඇතැයි සිතන්න. මෙය බොහෝ විට
(1) දේශීය නිෂ්පාදකයන් සඳහා සඵල ආරක්ෂණය අඩු කරයි.
(2) දේශීය කර්මාන්ත සඳහා සඵල ආරක්ෂණය වැඩි කරයි.
(3) දේශීය අගය එකතු කිරීම මුළුමනින් ම ඉවත් කරයි.
(4) දේශීය නිෂ්පාදන දිරිගැන්වීම අඩු කරයි.
(5) විදේශ සෘජු ආයෝජන ගලා ඒම අධෛර්යමත් කරයි.

**38.** ලෝක වෙළෙඳ සංවිධානයේ කාර්යයක් **නො** වනුයේ පහත සඳහන් කවරක් ද?
(1) බහු-පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම
(2) වෙළෙඳ සාකච්ඡා සඳහා වේදිකාවක් සැපයීම
(3) සාමාජික රටවල් අතර වෙළෙඳ ආරවුල් විසඳීම
(4) සාමාජික රටවලට දිගු කාලීන ණය ලබා දීම
(5) සාමාජික රටවල වෙළෙඳ ප්‍රතිපත්ති නියාමනය කිරීම

**39.** ගෙවුම් ශේෂයේ ඇති ද්විතීය ආදායම් ගිණුම, ප්‍රාථමික ආදායම් ගිණුමෙන් වෙනස් වන්නේ
(1) සාධක ආදායම් ගෙවීම් පමණක් සටහන් කරන නිසා ය.
(2) ප්‍රේෂණ හා විදේශ ආධාර ඇතුළු සියලු ම සංක්‍රාම ඉන් බැහැර කරන නිසා ය.
(3) ප්‍රේෂණ වැනි ඒකපාර්ශ්වීය සංක්‍රාම එහි ඇතුළත් කරන නිසා ය.
(4) රජයේ සුරැකුම්පත් මත ලැබෙන ආයෝජන ආදායම් පමණක් එහි සටහන් කරන නිසා ය.
(5) විදේශ ණය මත පොලී ගෙවීම් පමණක් එහි සටහන් කරන නිසා ය.



Scanned with CamScanner

**40.** නිදහස්ව පාවෙන විනිමය අනුපාතික ක්‍රමයක් තුළ, වෙළෙඳපොළ බලවේග මගින් රටක වෙළෙඳ ශේෂයේ හිගයක් හෝ අතිරික්තයක් ස්වයංක්‍රිය ව අඩු කිරීමට හේතු වන්නේ පහත ඒවා අතරින් කුමක් ද?

(1) හිගයක් ඇති වූ විට, එම රටේ ව්‍යවහාර මුදල සඳහා අධි ඉල්ලුමක් ඇති වී, විනිමය අනුපාතිකය ක්ෂය වන නිසා ය.
(2) හිගයක් ඇති වූ විට, එම රටේ ව්‍යවහාර මුදල් අධි සැපයුමක් ඇති වී, විනිමය අනුපාතිකය ඉහළ යන නිසා ය.
(3) අතිරික්තයක් ඇති විට, එම රටේ ව්‍යවහාර මුදල සඳහා අධි ඉල්ලුමක් ඇති වී, විනිමය අනුපාතිකය ක්ෂය වන නිසා ය.
(4) අතිරික්තයක් ඇති වූ විට, එම රටේ ව්‍යවහාර මුදල් අධි සැපයුමක් ඇති වී, විනිමය අනුපාතිකය ක්ෂය වන නිසා ය.
(5) හිගයක් ඇති වූ විට, එම රටේ ව්‍යවහාර මුදල් අධි සැපයුමක් ඇති වී, විනිමය අනුපාතිකය ක්ෂය වන නිසා ය.

**41.** විදේශ ආයෝජකයකු ශ්‍රී ලංකාවේ චතු සමාගමක කොටස් 5% ක් මිලදී ගනී. මෙම ගනුදෙනුව ශ්‍රී ලංකාවේ ගෙවුම්ශේෂ ලේඛනයෙහි වාර්තා කරනුයේ පහත සඳහන් කවර ආකාරයට ද?

(1) මූල්‍ය ගිණුමේ සෘජු ආයෝජන හර කිරීමක් ලෙස ය.
(2) මූල්‍ය ගිණුමේ සෘජු ආයෝජන බැර කිරීමක් ලෙස ය.
(3) මූල්‍ය ගිණුමේ කළඹ ආයෝජන හර කිරීමක් ලෙස ය.
(4) මූල්‍ය ගිණුමේ කළඹ ආයෝජන බැර කිරීමක් ලෙස ය.
(5) ප්‍රාග්ධන ගිණුමේ ප්‍රාග්ධන සංක්‍රාම බැර කිරීමක් ලෙස ය.

**42.** කිසියම් රටකට ගෙවුම් ශේෂයෙහි ජංගම ගිණුමේ හිගයක සිට අතිරික්තයකට මාරු වීමෙහි ලා වඩාත් උපකාර විය හැක්කේ පහත සඳහන් කවර කරුණක් ද?

(1) විදේශ ආයෝජකයන් ආකර්ෂණය කරන අයුරින් පොලී අනුපාතික ඉහළ යාම
(2) දේශීය වියදම් වැඩි වීම සහ මුදල් ඒකකය ශක්තිමත් වීම
(3) විදේශගත ශ්‍රමිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ වැඩිවීම හා මුදල් ඒකකයේ අගය දුර්වල වීම
(4) අපනයන මිල ගණන් ඉහළ යාම සහ විදේශ ණය සඳහා පොලී ගෙවීම් වැඩි වීම
(5) ව්‍යාපාරික ආයෝජන වැඩි වීම සහ කළඹ ආයෝජන අඩු වීම

**43.** සුබසාධනය මැනීමේ දර්ශකයක් ලෙස දළ දේශීය නිෂ්පාදිතය (GDP) භාවිත කිරීම පිළිබඳ ප්‍රධාන විවේචනයක් වන්නේ දළ දේශීය නිෂ්පාදිතය

(1) වෙළෙඳපොළෙන් පිටත සිදුවන ආර්ථික ක්‍රියාකාරකම් සහ පාරිසරික පිරිවැය නොසලකා හරින බව ය.
(2) නාමික නිෂ්පාදනය පමණක් මනින අතර මූර්ත නිෂ්පාදිතය කිසිවිටකත් මිනුම් නොකරන බව ය.
(3) සංක්‍රාම ගෙවීම් වත්මන් නිෂ්පාදනයෙහි කොටසක් ලෙස ඇතුළත් කරගන්නා බව ය.
(4) භාණ්ඩ නිෂ්පාදනය පමණක් වාර්තා කරන අතර සේවා බැහැර කරන බව ය.
(5) පොදු සේවා සඳහා රජය දරන සියලු වියදම් බැහැර කරන බව ය.

**44.** ආර්ථික සංවර්ධනයේ බහුමානීය ස්වභාවය වඩාත් හොඳින් පැහැදිලි කරනුයේ පහත සඳහන් කුමන ප්‍රකාශය ද?

(1) ආර්ථික සංවර්ධනය යනු ප්‍රති ශීර්ෂ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වැඩි වීම ය.
(2) ආර්ථික සංවර්ධනය යනු ආදායම වැඩි වීම, ජීවන තත්ත්වය වැඩි දියුණු වීම හා සමාජ ප්‍රගතිය ඇති වීම ය.
(3) ආර්ථික සංවර්ධනය සිදුවන්නේ කෘෂි කාර්මික අංශයේ වැදගත්කම අඩු වන විට ය.
(4) ආර්ථික සංවර්ධනය ප්‍රධාන වශයෙන් ප්‍රාග්ධන ආයෝජනය මත රඳා පවතී.
(5) ආර්ථික සංවර්ධනය අත්කර ගනුයේ විරැකියාව, දරිද්‍රතාවය සහ උද්ධමනය අඩු වන විට ය.

**45.** කිසියම් රටක ආදායමේ ගිනි සංගුණකය පළමු වසරේ දී 0.39 සිට දෙවන වසරේ දී 0.44 දක්වා ඉහළ යයි. ගිනි සංගුණකයේ මෙම වැඩි වීමට වඩාත් ඉඩක් ඇත්තේ රජයේ සමාජ ආරක්ෂණ හා බදු ප්‍රතිපත්ති වෙනස්වීම්වල කවර සංයෝජනයකටද?

| | අඩු ආදායම් කුටුම්බ වෙත ලබා දෙන සංක්‍රාම | ආන්තික පෞද්ගලික ආදායම් බදු අනුපාතිකය |
|---|---|---|
| (1) | අඩු කිරීම | අඩු කිරීම |
| (2) | වැඩි කිරීම | නොවෙනස් ව තිබීම |
| (3) | වැඩි කිරීම | වැඩි කිරීම |
| (4) | නොවෙනස් ව තිබීම | වැඩි කිරීම |
| (5) | වැඩි කිරීම | නොවෙනස් ව තිබීම |

PAST PAPERS WIKI

[නවවැනි පිටුව බලන්න



Scanned with CamScanner

**46.** පහත ප්‍රකාශවලින් කවරක් ආදායම් දරිද්‍රතාව හා බහුමාන දරිද්‍රතාව අතර වෙනස නිවැරදි ව වෙන්කොට දක්වන්නේ ද?
(1) ආදායම් දරිද්‍රතාව ආහාර වියදම් කෙරෙහි පමණක් අවධානය යොමු කරන අතර, බහුමාන දරිද්‍රතාව අධ්‍යාපනය කෙරෙහි පමණක් අවධානය යොමු කරයි.
(2) ආදායම් දරිද්‍රතාව ප්‍රමාණවත් ආදායමක් නොමැතිකම මනින අතර, බහුමාන දරිද්‍රතාව ජීවිතයේ විවිධ මානයන්හි ඇති අහිමිවීම් මනිනු ලබයි.
(3) ආදායම් දරිද්‍රතාව ලෝක බැංකුව විසින් පමණක් ගණනය කරනු ලබන අතර බහුමාන දරිද්‍රතාව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් පමණක් ගණනය කෙරේ.
(4) ආදායම් දරිද්‍රතාව සෞඛ්‍ය හා අධ්‍යාපනය බැහැර කරන අතර, බහුමාන දරිද්‍රතාව සෞඛ්‍ය හා ජීවන තත්ත්වය බැහැර කරයි.
(5) ආදායම් දරිද්‍රතාව පරිභෝජනය කෙරෙහි පමණක් අවධානය යොමු කරන අතර, බහුමාන දරිද්‍රතාව උද්ධමනය සඳහා ගළපන ලද වැටුප් අනුපාතිකය කෙරෙහි පමණක් අවධානය යොමු කරයි.

**47.** 2024 ජන හා නිවාස සංගණනයට අනුව, වර්තමාන ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ප්‍රජා විද්‍යාත්මක වෙනස වඩාත් හොඳින් විස්තර කරන්නේ පහත සඳහන් කවර ප්‍රකාශය ද?
(1) ඉහළ ස්වාභාවික වර්ධනය හා ඉහළ සාඵල්‍යතාව මත ජනගහන වර්ධනය සිදු වේ.
(2) ඉහළ සාඵල්‍යතා අනුපාත හේතුවෙන් ළමා ජනගහනයේ ප්‍රතිශතය වේගයෙන් වැඩි වේ.
(3) අඩු උපත් අනුපාත හා දිගු ආයු අපේක්ෂාව හේතුවෙන් වියපත් ජනගහන ප්‍රතිශතය වැඩි වේ.
(4) වැඩ කරන වයසේ ජනගහනයේ ශීඝ්‍ර වැඩි වීම නිසා යැපුම් අනුපාතය අඩු වේ.
(5) උපත් අනුපාතය ඉහළ යාම නිසා මධ්‍යස්ථ වයස අඩු වීම.

**48.** නවතම නිල දත්තවලට අනුව 2025 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ප්‍රතිශීර්ෂ දළ දේශීය නිෂ්පාදිතය ඇමෙරිකානු ඩොලර්
(1) 4 428කි. (2) 4 546කි. (3) 4 910කි. (4) 5 003කි. (5) 5 010කි.

**49.** ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික වෘද්ධි අපේක්ෂා හමුවේ ඇති ප්‍රධාන අවදානමක් වන්නේ
(1) අපනයන නැඹුරු කර්මාන්ත සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍රවල තරගකාරීත්වය අඩු වීම යි.
(2) වියපත් ජනගහනය රාජ්‍ය මූල්‍යය මත ඇති කරන පීඩනය වැඩි වීම යි.
(3) කර්මාන්ත අංශයෙහි සහ ඒ හා සම්බන්ධ සේවා ක්ෂේත්‍රවල ඵලදායිතා වර්ධනය දුර්වල වීම යි.
(4) ආර්ථිකය පුරාම පෞද්ගලික ආයෝජන විශ්වාසය දිගින් දිගට ම දුර්වල වීම යි.
(5) ගෝලීය වෙළෙඳ අවිනිශ්චිතතා, බාහිර කම්පන සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම පමා කිරීම යි.

**50.** බාහිර කම්පනවලට ඔරොත්තු දීමෙහි ලා ශ්‍රී ලංකාවට ඇති හැකියාව ශක්තිමත් කරන, වඩාත් ඵලදායි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගය කුමක් ද?
(1) නිෂ්පාදන මට්ටම් පවත්වාගෙන යාම සඳහා ආනයනය මත රඳා පවත්නා කර්මාන්ත සඳහා පුළුල් සහනාධාර ලබා දීම.
(2) විදේශ විනිමය වෙළෙඳපොළෙහි අඛණ්ඩ මැදිහත්වීම් මගින් ස්ථාවර විනිමය අනුපාතිකයක් පවත්වාගෙන යාම.
(3) විදේශ විනිමය සංචිත ගොඩ නගා ගනිමින් අපනයන භාණ්ඩ හා අපනයන වෙළෙඳපොළ විවිධාංගීකරණය කිරීම.
(4) සංවර්ධන වියදම් මූල්‍යනය සඳහා කෙටි කාලීන විදේශ ණය මත වැඩි වශයෙන් රඳා පැවතීම.
(5) ගෝලීය වෙළෙඳපොළ උච්චාවචනයන්ට නිරාවරණය වීම අවම කිරීම සඳහා සියලු ම ආනයන භාණ්ඩ මත තීරුබදු ඉහළ නැංවීම.

***

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

ආර්ථික විද්‍යාව II
பொருளியல் II
Economics II

**21 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**

※ 'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

※ ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

## 'අ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

**1.** (i) හිඟකම විසින් ස්වාභාවික සම්පත් ආර්ථික භාණ්ඩ බවට පරිවර්තනය කරනු ලබන්නේ කෙසේ ද යන්න පැහැදිලි කරන්න. ඔබේ පිළිතුර පැහැදිලි කිරීමට ජලය හෝ වාතය උදාහරණයක් ලෙස භාවිත කරන්න. (ලකුණු 03යි)

(ii) ඩිජිටල් භාණ්ඩ (උදා. මෘදුකාංග, විද්‍යුත් පොත්) වර්ග කළ යුත්තේ ආර්ථික භාණ්ඩ ලෙස ද නැතහොත් අර්ධ-නොමිල භාණ්ඩ ලෙස ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) නිෂ්පාදන ක්‍රියාවලියේ දී ව්‍යවසායකයන් විසින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iv) මිල යාන්ත්‍රණය මගින් වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක හිඟ සම්පත් බෙදා වෙන් කරනුයේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(v) ශ්‍රී ලංකාවේ ආර්ථිකය මිශ්‍ර ආර්ථික පද්ධතියක් බව පෙන්වන ප්‍රධාන ලක්ෂණ **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05යි)

**2.** (i) නිෂ්පාදන ආයතනයක සැපයුම් ශ්‍රිතය $Q_S = -40 + 10P$ ලෙස දී ඇතැයි සලකන්න.

(අ) ඒකකයක මිල රු.10ක් වන විට සැපයුම් ප්‍රමාණය තීරණය කරන්න. (ලකුණු 01යි)

(ආ) සැපයුම් ප්‍රමාණය ධනාත්මක ප්‍රමාණයක් වීම සඳහා අවශ්‍ය කරන අවම මිල කොපමණ විය යුතු ද? (ලකුණු 02යි)

(ii) (අ) ඉල්ලුම් නීතිය පදනම් කර ගන්නා උපකල්පන සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) ඉල්ලුම් නීතිය ක්‍රියාත්මක නොවන අවස්ථා සඳහන් කරන්න. (ලකුණු 02යි)

(iii) භාණ්ඩයක මිල ඉහළ යාමෙන් අනතුරු ව, පාරිභෝගිකයන් එම භාණ්ඩයෙන් මිල දී ගන්නා ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩු කරන්නේ ද යන්න තීරණය කරන සාධක **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)

(iv) කෘෂිකාර්මික භාණ්ඩ සැපයුම සාමාන්‍යයෙන් මෘදුකාංග සැපයුමට වඩා අඩු මිල නම්‍යතාවක් දක්වන්නේ ඇයි දැයි විග්‍රහ කරන්න. (ලකුණු 04යි)

(v) පාරිභෝගිකයන්ගේ ආදායම ඇතුළු ඉල්ලුමට බලපාන අනෙකුත් සියලු ම සාධක ස්ථාවර ව පවතින අතර පාන් ගෙඩියක මිල රු. 140 සිට රු. 180 දක්වා ඉහළ යන්නේ යැයි සිතන්න.

(අ) පාන් ගිෆන් භාණ්ඩයක් වේ'යැයි උපකල්පනය කරමින් මිල වෙනස්වීම සමග ඇතිවන ආදේශන සහ ආදායම් ප්‍රතිවිපාක රූපසටහනක් භාවිතයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03යි)

(ආ) ගිෆන් ස්වරූපයේ පාරිභෝගික හැසිරීමක් හට ගැනීම සඳහා අවශ්‍ය කරන කොන්දේසි **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි)

[දෙවැනි පිටුව බලන්න

CamScanner

3. (i) (අ) 'කළුකඩ වෙළෙඳපොළක්' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(ආ) වෙළෙඳපොළට කෙරෙන රජයේ මැදිහත්වීම් කළුකඩ වෙළෙඳපොළ බිහිවීමට කෙසේ හේතු විය හැකි දැ යි උදාහරණ දෙකක් යොදා ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) පාරිභෝගික භාණ්ඩයක් සඳහා නිෂ්පාදකයාට ඒකක සහනාධාරයක් ලබා දීමෙන් පහත සඳහන් දෑ මත ඇතිවන ප්‍රතිවිපාක රූපසටහනක් යොදා ගනිමින් විග්‍රහ කරන්න.

(අ) ආර්ථික අතිරික්තය

(ආ) රජයේ පිරිවැය

(ඉ) අහිමි වූ සුබසාධනය (DWL) (02 × 3 = ලකුණු 06යි)

(iii) තරගකාරී වෙළෙඳපොළක අලෙවි කරනු ලබන එක්තරා භාණ්ඩයක් සඳහා ඒකකයක් රු. 50ක අවම මිලක් රජය විසින් පනවනු ලැබී යැයි සලකන්න. එම වෙළෙඳපොළෙහි ඉල්ලුම් හා සැපයුම් ශ්‍රිත පහත සඳහන් සමීකරණවලින් නිරූපණය කෙරේ.

$Q_D = 200 - 2P$ $\quad\quad$ $Q_S = -40 + 4P$

(අ) වෙළෙඳපොළෙහි අවම මිල නියම කිරීමට පෙර සහ ඊට පසු පාරිභෝගික අතිරික්ත ගණනය කරන්න. (ලකුණු 04යි)

(ආ) වෙළෙඳපොළෙහි අධි සැපයුමක් නො පවතී යැයි උපකල්පනය කරමින්, අවම මිලට පෙර සහ ඊට පසු නිෂ්පාදිත අතිරික්ත ගණනය කරන්න. (ලකුණු 04යි)

4. (i) කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතයේ ප්‍රධාන අදියර තුන රූපසටහනක් යොදා ගනිමින් පෙන්නුම් කරන්න. (ලකුණු 03යි)

(ii) (අ) පරිමාණානුකූල පිරිමැසුම් යන්නෙන් අදහස් කරනුයේ කුමක් ද? (ලකුණු 01යි)

(ආ) අභ්‍යන්තර සහ බාහිර පරිමාණානුකූල පිරිමැසුම් අතර වෙනස දක්වන්න. (ලකුණු 02යි)

(iii) කෙටි කාලයේ දී නිෂ්පාදනයේ නිරතව සිටින පූර්ණ තරගකාරී ආයතනයක දැනට පවත්නා පිරිවැය හා ආදායම් මට්ටම් පිළිබඳ පහත සඳහන් තොරතුරු සපයා ඇත.

සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) = රු. 90
සාමාන්‍ය මුළු පිරිවැය (ATC) = රු. 115
වෙළෙඳපොළ මිල (ඒකකයක්) = රු. 100

(අ) කෙටි කාලයේ දී මෙම ආයතනය නිෂ්පාදනය අඛණ්ඩ ව කරගෙන යා යුතු ද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) ආයතනය ලාභයක් ලබනවා ද නැතහොත් අලාභයක් ලබනවා ද? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(iv) ඇඟලුම් නිෂ්පාදන ආයතනයක් වාර්ෂික ව රු. මිලියන 16ක වටිනාකමින් යුත් ඇඟලුම් අලෙවි කරයි. එම ආයතනය විසින් පහත සඳහන් වාර්ෂික පිරිවැය දරනු ලැබේ.

| අයිතමය | වටිනාකම (රු.) | අයිතමය | වටිනාකම (රු.) |
|---|---|---|---|
| අමුද්‍රව්‍ය | 3 500 000 | බැංකුවලට ගෙවන ලද පොලිය | 1 000 000 |
| වැටුප් | 3 000 000 | ආයතනයේ ආයෝජනය කළ අයිතිකරුගේ ප්‍රාග්ධනය | 10 000 000 |
| ගෙවන ලද බදු කුලිය | 120 000 | වෙළෙඳපොළ පොලී අනුපාතිකය | 12% |
| රක්ෂණ ගාස්තු | 500 000 | අයිතිකරු විසින් අහිමිකරගත් වාර්ෂික වේතන | 1 800 000 |
| උපයෝජ්‍ය සේවා | 880 000 | | |

ඉහත තොරතුරු ආශ්‍රයෙන් පහත සඳහන් දෑ ගණනය කරන්න:

(අ) මුළු ප්‍රත්‍යක්ෂ පිරිවැය

(ආ) මුළු ආරෝපිත පිරිවැය

(ඉ) මුළු ආර්ථික පිරිවැය

(ඊ) ගිණුම්කරණ ලාභය

(උ) ආර්ථික ලාභය (02 × 5 = ලකුණු 10යි)

[තුන්වැනි පිටුව බලන්න



CamScanner

5. (i) (අ) ජාතික ගිණුම් සැකසීමේ දී යොදා ගැනෙන 'නිෂ්පාදන ඉම' සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(ආ) දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී, ගෘහ ඒකක තුළ සිදුකරන ආහාර පිසීම බැහැර කරන අතර, ආපනශාලා මගින් සපයන ආහාර සේවා ඇතුළත් කරන්නේ ඇයි ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 03යි)

(ii) කල්පිත ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාළ දත්ත කිහිපයක් පහත වගුවෙහි ඉදිරිපත් කෙරේ.

| අයිතමය | වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|
| මූලික මිල යටතේ නිමැවුමේ දළ වටිනාකම (GVO) | 30 000 |
| අතරමැදි පරිභෝජනය | 5 000 |
| සේවක ආදායම | 6 000 |
| දළ මිශ්‍ර ආදායම | 8 500 |
| නිෂ්පාදනය මත සහනාධාර අඩු කළ වෙනත් බදු | 500 |
| නිෂ්පාදිත මත සහනාධාර අඩු කළ බදු | 1 000 |

(අ) දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන්න. (ලකුණු 02යි)

(ආ) දළ මෙහෙයුම් අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 02යි)

(iii) පහත දැක්වෙන්නේ කල්පිත ආර්ථිකයක් සම්බන්ධ සාර්ව ආර්ථික දත්ත කිහිපයකි.

$C = 300 + 0.8\ Yd;$ $I = 250;$ $G = 150;$ $T = 100;$

පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම = 3500 (සියලු ම අගයන් රුපියල් මිලියනවලිනි).

(අ) සමතුලිත ජාතික ආදායම් මට්ටම ගණනය කරන්න. (ලකුණු 02යි)

(ආ) ආර්ථිකයේ උද්ධමනාත්මක පරතරයේ හෝ අවධමනාත්මක පරතරයේ ප්‍රමාණය නිර්ණය කරන්න. (ලකුණු 02යි)

(ඉ) පූර්ණ සේවා නියුක්තිය අත්කර ගැනීම සඳහා ආණ්ඩුවේ බදු කොතරම් ප්‍රමාණයකින් වෙනස්විය යුතු දැයි ඇස්තමේන්තු කරන්න. (ලකුණු 02යි)

(iv) (අ) පරිලේඛන (inventories) යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 02යි)

(ආ) සමාහාර වියදම සහ සමාහාර ඉල්ලුම අතර වෙනස සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 03යි)

## 'ආ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)

6. (i) කිසියම් ආර්ථිකයක් ගත වූ වසර හතර සඳහා පහත සඳහන් වාර්ෂික උද්ධමන අනුපාතික වාර්තා කරයි.

1වන වසර = 16%; 2වන වසර = 10%;
3වන වසර = 4%; 4වන වසර = −3%;

මෙම දත්ත අනුව උද්ධමනය, නිරුද්ධමනය සහ අවධමනය පැවැති කාලපරිච්ඡේද සඳහන් කරන්න. (ලකුණු 03යි)

(ii) (අ) ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය සහ පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(ආ) සමාහාර ඉල්ලුම හා සමාහාර සැපයුම පිළිබඳ විග්‍රහය යොදා ගෙන එක් එක් උද්ධමන වර්ගය කෙසේ ඇති වන්නේ ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) කිසියම් වාණිජ බැංකුවක ශේෂ පත්‍ර අයිතමයන් පහත වගුව ඉදිරිපත් කරයි.

| අයිතමය | වටිනාකම (රුපියල් මිලියන) | අයිතමය | වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|---|---|
| සල්ලි සංචිත | 100 | ස්ථාවර වත්කම් | 50 |
| කාලීන තැන්පතු | 200 | ඉතුරුම් තැන්පතු | 250 |
| ප්‍රාග්ධනය | 50 | ණය හා අත්තිකාරම් | 800 |
| ආණ්ඩුවේ සුරැකුම්පත් | 150 | ඉල්ලුම් තැන්පතු | 600 |

(අ) මෙම වාණිජ බැංකුවේ ශේෂ පත්‍රය සකස් කරන්න. (ලකුණු 02යි)

(ආ) වාණිජ බැංකුවේ මුළු ද්‍රවශීල වත්කම් ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 01යි)

(ඉ) වාණිජ බැංකුවේ මුළු තැන්පතු ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 01යි)

(iv) (අ) ශ්‍රී ලංකාවේ සංචිත මුදල් සංරචක කවරේ ද? (ලකුණු 03යි)

(ආ) මහ බැංකුවට සංචිත මුදල් සංකෝචනය කළ හැකි වන්නේ කෙසේ දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

[හතරවැනි පිටුව බලන්න

Past Papers Wiki
PAST PAPERS WIKI
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න
CamScanner

7. (i) (අ) සුඛසාධන භාණ්ඩ සහ අවගුණ භාණ්ඩ නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(ආ) නිදහස් වෙළෙඳපොළක් තුළ සුඛසාධන භාණ්ඩවල ඌනා පරිභෝජනයක් සිදු වන්නේ ඇයි ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය බදු අයභාරයේ ප්‍රධාන මූලාශ්‍ර **තුනක්** දක්වන්න. (ලකුණු 03යි)

(iii) රාජ්‍ය ව්‍යවසායන් පවත්වා ගැනීමේ ආර්ථික යුක්තිසහගතභාවය පරීක්ෂා කරන්න. (ලකුණු 03යි)

(iv) කල්පිත ආර්ථිකයක රාජ්‍ය මූල්‍යය හා සම්බන්ධ වාර්ෂික දත්ත කිහිපයක් පහත දක්වා ඇත.

| අයිතමය | වටිනාකම (රු. බිලියන) |
|---|---|
| මුළු ආදායම | 5 400 |
| ප්‍රදාන | 100 |
| දළ මූල්‍යන අවශ්‍යතා | 2 400 |
| පොලී ගෙවීම | 2 500 |
| ප්‍රාග්ධන හා ශුද්ධ ණය දීම | 1 200 |
| ණය ආපසු ගෙවීම | 1 600 |

ඉහත දත්ත භාවිත කර පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) සමස්ත අයවැය ශේෂය

(ආ) මුළු වර්තන වියදම

(ඇ) ප්‍රාථමික වියදම

(ඈ) ප්‍රාථමික ශේෂය

(ඉ) වර්තන ගිණුමේ ශේෂය

(02 × 5 = ලකුණු 10යි)

8. (i) (අ) ස්ථිතික සාපේක්ෂ වාසිය හා ගතික සාපේක්ෂ වාසිය අතර වෙනස දක්වන්න. (ලකුණු 02යි)

(ආ) රටක ගතික සාපේක්ෂ වාසි වර්ධනය කර ගැනීම සඳහා රජයට ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** නම් කරන්න. (ලකුණු 04යි)

(ii) (අ) සංවර්ධනය වෙමින් පවතින රටවල් ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අනුගමනය කිරීමට බලපාන හේතු **තුනක්** දක්වන්න. (ලකුණු 03යි)

(ආ) නාමික ආරක්ෂණය සහ සඵල ආරක්ෂණය අතර වෙනස සඳහන් කරන්න. (ලකුණු 02යි)

(iii) ශ්‍රී ලංකාවේ අපනයන සංකේන්ද්‍රණය සහ ආනයන මත රැඳියාව, ගෝලීය කම්පන මගින් ඇති කෙරෙන අවදානම ඉහළ යාමට හේතු වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iv) (අ) 2026 වර්ෂයේ මුල් භාගයේ දී එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂ ව ශ්‍රී ලංකා රුපියලේ අගය ක්ෂයවීමට බලපෑ වැදගත් සාධක **තුනක්** නම් කරන්න. (ලකුණු 03යි)

(ආ) මෙම කාලපරිච්ඡේදය තුළ දී විනිමය අනුපාතිකය මත පීඩනය අඩුකරලීම සඳහා මහ බැංකුව සහ ශ්‍රී ලංකා රජය ගනු ලැබූ ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

9. (i) ආර්ථික සංවර්ධනය නිර්වචනය කරන්න. (ලකුණු 03යි)

(ii) ජාතික ආදායමේ වැඩිවීම පමණක් පදනම් කරගෙන සංවර්ධනය මැනිය නො හැක්කේ ඇයි දැයි විස්තර කරන්න. (ලකුණු 04යි)

(iii) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය හා වතු අංශවල බහුමාන දරිද්‍රතාව ඉහළ මට්ටමක පවතින්නේ ඇයි දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 04යි)

(iv) ශ්‍රී ලංකාව වර්තමානයේ 'මැදි ආදායම් උගුලකට' මුහුණදෙමින් සිටී ද නැද්ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(v) ශ්‍රී ලංකාවේ අඩු උපත් අනුපාතය, ශ්‍රම සැපයුම සහ ආර්ථික වර්ධනය කෙරෙහි ඇති කෙරෙන දිගු කාලීන බලපෑම විග්‍රහ කරන්න. (ලකුණු 05යි)

10. (i) "බස්නාහිර පළාත ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට අසමානුපාතික ලෙස විශාල දායකත්වයක් සපයන අතර, අනෙකුත් පළාත්වල දායකත්වය සාපේක්ෂ ව අඩු ය". ආර්ථික ක්‍රියාකාරකම් බස්නාහිර පළාත තුළ සංකේන්ද්‍රණය වී තිබීමට හේතු **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05යි)

(ii) ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවත්නා ආර්ථික මත දේශගුණය ආශ්‍රිත විපත් මගින් ඇතිවන ආර්ථික ප්‍රතිවිපාක මොනවා ද? (ලකුණු 05යි)

(iii) ශ්‍රී ලංකාවේ දිගු කාලීන සංවර්ධන උපාය මාර්ගයේ කොටසක් ලෙස කෘෂිකාර්මික අංශය ශක්තිමත් කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 05යි)

(iv) ඩිජිටල්කරණය ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට සහාය වන්නේ කෙසේ දැ යි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05යි)

* * *

0042060

PAST PAPERS WIKI
WWW.PastPapers.Wiki
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library
CamScanner